# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/07/SD/06/12/ජා.දු.වි./2025 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2025.05.15 |

***සමෘද්ධි චක්‍රලේඛ :- ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධි දිනය 2025/03***

*සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,*

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම විෂයභාර දිස්ත්‍රික් සමාජ සංවර්ධන/ප්‍රජාමූල කළමනාකරුවන්

සියළුම සමෘද්ධි කළමනාකරුවන්,

සියළුම සමාජ සංවර්ධන සහකාරවරුන්,

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්,

සියළුම ප්‍රජාමූල විෂයභාර සංවර්ධන නිලධාරීන්

සියළුම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරුන් හා ලේකම්වරුන්,

සියළුම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරුන් හා ලේකම්වරුන් වෙත.

## " සවිබලයෙන් රට දිනන්න - මත් රැහැනෙන් ඔබ මිදෙන්න "

## ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධි දිනය - 2025 මැයි 31- ජුනි 17

**" මතට දුම්වැටියට තබමු තිත සුමිතුරු - සවි බලැති දේශයක් ගොඩනගමු නිරතුරු "** යන තේමාව යටතේ පසුගිය වසරේ කොඩි පැළඳවීමේ වැඩසටහන මුල්කරගෙන මත්ද්‍රව්‍ය උවදුරින් ප්‍රජාව මුදා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඔබ දැක් වූ සහයෝගයට ප්‍රථමයෙන්ම දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ හා එම කාර්ය මණ්ඩලය ප්‍රාදේශීය ලේකම්වරු හා සියළුම සමෘද්ධි කළමනාකරුවන්, සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් ඇතුළු ප්‍රජාවට ස්තූතිය පුදකර සිටිමි.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

## *01. හැඳින්වීම*

2013 අංක 01 දරන සමෘද්ධි පනතට අනුව "ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමෙහිලා දිළිඳු බව තුරන් කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීමෙහිලා පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කර ගත් ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම " සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වේ. එකී පනතට අනුව දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සවිබල ගැන්වූ සමාජයක් බිහිකිරීම සඳහා අවශ්‍යවිය හැකි සංවර්ධන කටයුතු සිදු කිරීමේදී ඊට ප්‍රබල ප්‍රතිරෝධකයක්ව පවතින මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් ප්‍රජාව මුදා ගැනීම සඳහා ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2025 වර්ෂය පවුල් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ සාමාජීය, මානසික, සෞඛ්‍ය, පාරිසරික හා උපදේශණය තුලින් පවුල් සවිබල ගැන්වීම සමාජ සංවර්ධන අංශය වෙත පැවරී ඇති බැවින් දුම්වැටි හා මතින් ප්‍රජාව මුදාගෙන එම පවුල් සවිබල ගැන්වීමට මෙම වසරේ සමාජ සංවර්ධන අංශය මගින් මෙම වැඩසටහන දියත් කිරීමට සැලසුම් කර ඇත.

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ II කොටසේ 09 ඡේදයට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා iii කොටසේ 15 ඡේදයට අනුව සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන පිහිටුවා ඇති අතර එම සංවිධානවල සියළු ප්‍රජා නායකයින් හා වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්ගේ හා කළමනාකරුවන්ගේ මැදිහත්වීම ඇතිව ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

## *02. ක්‍රියාත්මක වන ආකාරය*

i. දිස්ත්‍රික් කාර්යාල වලින් ප්‍රජාමූල සංවිධාන මට්ටමින් ලබාගත් අවශ්‍යතාවයන්ට අනුව සකස් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වාර්තාවට අනුව මුද්‍රණය කරන ලද කොඩි, ස්ටිකර්,කැට ලේබල් 2025 මැයි 20 දින වන විට සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට විධිමත් පරිදි ලැබීමට සලස්වනු ඇත. ජාතික සමාජ සංවර්ධන අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයට අනුව මෙවර පෝස්ටර් 2000ක් පමණක් මුද්‍රණය කිරීමට තීරණය

කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිටින ප්‍රජාමූල සංවිධාන හා සමාජ සංවර්ධන විෂය භාර නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන්කරන ලද කොඩි,ස්ටිකර්,කැටලේබල් හා පෝස්ටර් එක් එක් සමෘද්ධි සමිති කළමනාකරු හෝ සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් වෙත 2025 මැයි 23 දිනට ප්‍රථම විධිමත් ලෙස භාර දිය යුතුයි.

- දිස්ත්‍රික් කාර්යාලයට - 04
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට - 01
- ප්‍රජාමූල බැංකු සමිතිය - 01
- සමෘද්ධි ප්‍රජාමූල බැංකුව - 01 බැගින් වන සේ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට පෝස්ටර් හා පාර්සල් කර ඇත.

ii. සියළුම සමෘද්ධි කළමනාකරුවන් හා සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්, ප්‍රජාමූල සංවර්ධන නිලධාරීන් විසින් අවශ්‍ය පරිදි කොඩි, ස්ටිකර්,කැටලේබල් හා පෝස්ටර් සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරු හා කලාප සහකාර මගින් 2025 මැයි 30 ට ප්‍රථම සියළුම වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ප්‍රජාමූල නායකයින් වෙත විධිමත් ලෙස භාර දිය යුතුයි.

iii. සියළුම වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සපයා ඇති කැට ලේබලය අලවා සීල් තබන ලද ආරක්ෂිත කැටයක් සකස් කර ගෙන තම වසමට අයත් ප්‍රජාමූල සංවිධාන වල සභාපති,ලේකම් හා භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව මෙන්ම සාමාජිකයින් සමග එක්ව එම සමෘද්ධි ප්‍රතිලාභීන් මගින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් හා දුම්වැටි හා මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවිඩය ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීමට කටයුතු කළ යුතුයි.

iv. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම මගින් අරමුදල් රැස් කිරීම 2025 මැයි 31 දින පෙ.ව 8.00 සිට 2025 ජුනි 17 දින පෙ.ව.10.00 තෙක් පමණක් සිදු කළ යුතුය. ජුනි 17 දින පෙ.ව.10.00න් පසු කොඩි පැළඳවීම තුළින් අරමුදල් රැස්කිරීම අනිවාර්යෙන්ම නතර කළයුතු අතර එදිනට පසු කිසිදු මුදලක් ලබාගැනීමට කටයුතු නොකළ යුතු අතර මත් නිවාරණ වැඩසටහන් පමණක් ක්‍රියාත්මත කිරීමට හැකියාව ඇත.

v. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමේ දී කිසිම හේතුවක් මත සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් හා ප්‍රජාවගෙන් බලහත්කාරයෙන් මුදල් එකතු කිරීම සිදු නොකළ යුතුය.

vi කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් "ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය" ප්‍රජාව අතර සිහිපත් කරමින් සමෘද්ධි ප්‍රතිලාභීන් මෙන් පොදු මහ ජනතාව දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදා ගෙන මානසික වශයෙන් සවිබල ගැන්වීමේ මුඛ්‍ය පරමාර්ථය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ.

Viiකොඩි හා ස්ටිකර් මහජනතාව වෙත පිළිගැන්වීමෙන් රැස් කරන මුදල් ප්‍රදේශයේ ප්‍රජාමූල සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල් වල දරුවන්ගේ සමාජ සුභසාධන කටයුතු සඳහා වැය කරන බව මහජනතාව වෙත දැනුම් දීමටද කටයුතු කළ යුතුයි. ප්‍රජාමූල සංවිධානයක සාමාජිකත්වය නොලබන කිසිඳු පුද්ගලයකුට මෙම ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි බව අවධාරණය කරමි.

Viii. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස් කරන ලද මුදල් සීල් තබන ලද කැටයට පමණක් බහාලිය යුතු අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කිසිදු නිලධාරියෙකු මුදල් රැස් නොකළ යුතුය. ප්‍රජාමූල සංවිධානවල සාමාජිකයන් වුවද අවිධිමත් ලෙස මුදල් රැස් කිරීම හෝ ලේඛනයක සඳහන් කර මුදල් රැස් කිරීම නොකළ යුතුයි. යම් පරිත්‍යාගශීලී ප්‍රභූවරයෙක් හෝ ධානපතියෙක් ඉහල වටිනාකමකින් යුත් මුදලක් ලබා දෙන්නේ නම් එය අදාළ ප්‍රජාමූල සංවිධානයේ බැංකු ගිණුමට බැර පිණිස ලියන ලද චෙක් පතක් මගින් හෝ ක්ෂේත්‍රයේ දී මුදල් භාර ගැනීම බැර පතක් (ලදුපතක්) වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් නිකුත් කිරීමෙන් පමණක් එම මුදල් භාර ගත යුතුයි.

Ix තවද කොඩි වැඩසටහන සාර්ථක කර ගැනීමට ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් විශේෂ වැඩසටහන් සංවිධානය කරගත හැකිය.

***03. එක් රැස් කළ මුදල් තැන්පත් කිරීම හා වාර්තා කිරීම.***

i. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් මුදල් රැස් කිරීම 2025 ජුනි මස 17 දින පෙ.ව.10.00 ට අවසන් කළ යුතුය. එදින පෙ.ව.10.00 සිට ප.ව. 1.00 දක්වා මුදල් බහාලන සීල් තබන ලද

කැට ප්‍රජාමූල සංවිධානයේ සභාපති හෝ ලේකම් සහ භාණ්ඩාගාරික විසින් වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී වෙත අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිශ්‍රයේදී භාර දිය යුතු අතර එදිනට පසු කිසිදු මුදලක් භාරගැනීමට කටයුතු නොකළ යුතුය.

ii. වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් ප්‍රජාමූල සංවිධානයේ සභාපති හෝ ලේකම් හා භාණ්ඩාගාරික විසින් සමෘද්ධි සංවර්ධන නිලධාරී හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරු ඉදිරියේ දී මුදල් බහාලන සීල් තබන ලද කැට විවෘත කළ යුතුයි.

iii. ඉහත 03 ii හි සඳහන් සියළුදෙනා ඉදිරියේදී ගණනය කරන ලද මුදල් විධිමත් පරිදි ලේඛනයක සඳහන් කර ඊට වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී සහ ප්‍රජාමූල සංවිධානයේ භාණ්ඩාගාරික විසින් අත්සන් තැබිය යුතුයි.

iv. රැස් කළ මුදල් ප්‍රජාමූල සංවිධානයේ භාණ්ඩාගාරික විසින් තම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය නමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ ආරම්භ කරන ලද සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුමට බැර කළ යුතුය.

v. සියළුම ප්‍රජාමූල සංවිධාන වලින් මුදල් බහාලන සීල් තබන ලද කැට සියල්ල විවෘත කර මුදල් තැන්පත් කළ පසු ඉහත 03 iii හි පරිදි සකස් කරන ලද ලේඛනය කලාප සහකාර හා අදාල වසමේ සමෘද්ධි කළමනාකරු විසින් අත්සන් තැබිය යුතුය. මෙහි මුල් පිටපත බැංකු සමිති කළමනාකරු වෙත යැවිය යුතු අතර ඡායා පිටපතක් බැංකුවේ ගොනු කර තැබිය යුතුය.

vi. සියළුම ප්‍රජාමූල සංවිධාන වෙතින් තැන්පත් කරන ලද කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස් කරන ලද මුදල් පමණක් එක් එක් ප්‍රජාමූල සංවිධානයේ සභාපති හා භාණ්ඩාගාරික ගේ ලිඛිත ඉල්ලීමකට අනුව ප්‍රාදේශීය සංවිධානය නමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ ආරම්භ කර ඇති සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුමට බැර පිණිස ලියන ලද චෙක්පතක් මඟින් 2025 ජුනි 25 දින ප.ව. 3.00ට පෙර යැවිය යුතුයි.

vii. බැංකු සමිති කලමණාකරුවන්ගේ අධීක්ෂණය යටතේ සමාජ සංවර්ධන සහකාර, ප්‍රජාමූල සංවර්ධන නිලධාරීන් විසින් සමෘද්ධි බැංකු කලමණාකරුවන්ගෙන් ලද එක් එක් ප්‍රජාමූල සංවිධානයෙන් රැස් කරන ලද මුදල් ඇතුළත් ලේඛනයේ එකතුව හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු

සමිති කලමණාකරු විසින් සකසන ලද තැන්පත් රැස් කිරීමේ තහවුරු ලිපියේ සඳහන් අගය සමඟ සමාන වන්නේ දැයි පරීක්ෂා කර ප්‍රාදේශීය සංවිධානයේ සභාපති /ලේකම් ගේ අත්සනින් යුත් ලිපියක් සමඟ කලාප මට්ටමින් එක් රැස්වූ මුදල් පිළිබඳ ලේඛනයක් 2025 ජුලි 15 දිනට පෙර ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යැවිය යුතුයි.

viii. දිස්ත්‍රික්කයේ සමාජ සංවර්ධන, ප්‍රජාමූල විෂයභාර නිලධාරී විසින් ප්‍රාදේශීය සංවිධාන වෙතින් ලැබෙන කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් එක් රැස් කළ මුදල් ඇතුළත් ලේඛන පරීක්ෂා කර නිවැරදි බවට තරවුරු කර ගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් ලේඛනය සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අත්සනින් යුත් ආවරණ ලිපියක් සමඟ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය භාර අධ්‍යක්ෂ වෙත 2025 ජුලි 22 දිනට ප්‍රථම යැවිය යුතුයි. ඒ සඳහා පහත ඇමුණුම භාවිත කළ යුතුය.

| අනු අංකය | ප්‍රා.ලේ.කො. නම | ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව | රැස්කළ මුදල රු. |
|---|---|---|---|
| | | | |
| | | | |
| | එකතුව | | |

## *04. උත්සව හා විශේෂිත වැඩසටහන්*

i. ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය දිවයිනේ සෑම පුරවැසියකුටම අවබෝධ වන පරිදි සිහිපත් කිරීමත් ඒ වෙනුවෙන් සුවිශේෂී වැඩසටහන් හා උත්සව සංවිධානය කළ යුතු වේ.

ii. සෑම ග්‍රාම නිලධාරී වසමක් ම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් 2025 මැයි 31 දින පෙ.ව 11.00 ට ප්‍රථම දුම්වැටි හා මත් උවදුරින් ප්‍රජාව මුදා ගැනීමේ වැඩසටහන් හා කොඩි පැළදීමේ විශේෂිත උත්සවයක් තම කාර්යාලය අභියස සංවිධානය කළ යුතු අතර එහි දී ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිටින ආගමික නායකයින්,ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන් හා ප්‍රජාව සම්බන්ධ කර ගත යුතුයි.

iii. සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක්ම ආවරණය වන පරිදි බැංකු කළමනාකරු විසින් තම බැංකු පරිශ්‍රය තුළ 2025 මැයි 31 දින පෙ.ව.11.30 ට කොඩි පැළදීමේ විශේෂිත උත්සවයක්

හා දුම්වැටි හා මත් උවදුරින් ප්‍රජාව මුදා ගැනීමේ සුවිශේෂී වැඩසටහන්(විද්‍යාත්මක ක්‍රම වේදයන් අනුගමනය කරමින්) සංවිධානය කළ යුතුයි. එහිදී ආගමික නායකයින්, ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන්, ප්‍රජා නායකයින් හා ගණුදෙනුකරුවන් සම්බන්ධ කර ගත යුතුයි.

iv. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත බැංකු සමිති කළමනාකරු, මූලස්ථාන සමෘද්ධි කලමණාකරු, බැංකු සමෘද්ධි කළමනාකරු, ප්‍රජාමූල විෂයය භාර නිලධාරීන් හා සමාජ සංවර්ධන සහකාර විසින් 2025 මැයි 31 දින පෙ.ව. 11.30 කොඩි පැළඳවීමේ විශේෂිත උත්සවයක් හා දුම්වැටි හා මත් උවදුරින් ප්‍රජාව මුදා ගැනීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී සංවිධානය කළ යුතුය. එහිදී ආගමික නායකයින්, ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන්, ප්‍රජාව, තරුණ තරුණියන් හා හැකි අවස්ථාවල අදාල අනුමැතිය සහිතව පාසල් දරුවන් සහභාගී කර ගත යුතුයි.

v. සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයක් තුලම දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අධීක්ෂණයෙන් සමාජ සංවර්ධන හා ප්‍රජාමූල සංවිධාන විෂය භාර නිලධාරීන් විසින් විශේෂිත උත්සවයක් 2025 මැයි 31 දින පෙ.ව.11.30 ට සංවිධාන කළ යුතුයි. එහිදී ආගමික නායකයින්, ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන් ප්‍රජාව හා තරුණ තරුණියන් සහභාගී කර ගත යුතුයි.

vi. ඉහතින් දැක්වෙන පරිදි ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලද විශේෂිත උත්සවයේ දී දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව හා ඉන් වැළකී සිටීමෙන් ලැබෙන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ පිළිඳව දැනුවත් කිරීමක් සිදු වන පරිදි දේශන පැවැත්වීමට සැලසුම් කල යුතු වේ.

vii. ඉහතින් සඳහන් කළ පරිදි අදාළ උත්සව අවසානයේදී එක් එක් කාර්යාල පරිශ්‍රය පිහිටි ප්‍රජාමූල සංවිධාන බල ප්‍රදේශයේ සාමාජිකයින් කිහිප දෙනෙකු හෝ ළමා සමාජ දරුවන් කැඳවා ඔවුන් මඟින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් පසු මුදල් රැස්කිරීමට කටයුතු කළ යුතු වේ.

viii. මෙම කටයුතු සිදු කිරීමේදී රාජ්‍ය නිලධාරීන්ට අමතරව ප්‍රජා සංවිධානවල නායකයින් සෑම අවස්ථාවකම සහභාගී කරගත යුතුය.

ix. 2025 මැයි 31 දින ජාත්‍යන්තර දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී දිනය සිහි ගන්වමින් උත්සව පවත්වන අවස්ථා වලදී හෝ ඊට පසු අවස්ථා වලදී වීදි නාට්‍ය, චිත්‍ර ප්‍රදර්ශන, පෝස්ටර් ප්‍රදර්ශන, පාගමන්, හා ප්‍රජා සෞඛ්‍යයට වන හානි ඇතුලත් දැනුවත් කිරීම් (විද්‍යාත්මක ක්‍රමවේදයට අනුව) වැනි විශේෂිත වැඩසටහන් සංවිධානය කර ගැනීමට අවස්ථාව ඇත.

x. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම හා සෑම සමෘද්ධි බැංකුවක් ආසන්නයේම 2025 දුම්වැටි විරෝධී කොඩි වැඩසටහනෙහි තේමාව ප්‍රදර්ශනය වන පරිදි හා දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබිඹු වන අයුරින් ප්‍රජාව දැනුවත් කිරීම උදෙසා නිර්මාණශීලීව සකස් කරගත් බැනරයක් ප්‍රදර්ශනය කිරීම සුදුසු වේ. මේ සඳහා ප්‍රජාමූල බැංකුව, ප්‍රජාමූල සංවිධාන අරමුදල් භාවිතා කිරීමට හැකියාව ඇත. (එම සංවිධානවල අනුමැතිය ඇතිව)

මෙම කොඩි පැළඳවීමේ උත්සවය හා විශේෂිත වැඩසටහන් සඳහා යම් මුදලක් වැය කිරීමට අවශ්‍ය වන්නේ නම් පමණක්, පසුගිය වසරේ එක්රැස්කරන ලද කොඩි අරමුදලින් රු. 10,000ක උපරිමයකට යටත්ව අදාල සංවිධානවල අනුමැතිය හා මූල්‍ය රෙගුලාසි වලට යටත්ව සිදු කිරීමට හැකියාව ඇත.

***05. ඇගයීම් ක්‍රමය***

i. ප්‍රජාව වෙත කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස්කල වැඩිම මුදල් ප්‍රමාණ සැලකිල්ලට ගෙන ඇගයීමට ක්‍රමවේදයක් ග්‍රාම නිලධාරී වසම්, සමෘද්ධි බැංකු, සමෘද්ධි බැංකු සමිති, සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශිය සංවිධාන හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් සකස් කිරීමට නියමිතය.

ii. සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවෙකු විසින්ම බැංකු කලාපය තුළ පිහිටි සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන අතුරින් වැඩිම මුදල් ප්‍රමාණයක් රැස්කල ප්‍රජාමූල සංවිධානය හා මුදල සඳහන් කරමින් බැංකු සමිති කලමණාකරු වෙත 2025 ජුලි 31 දිනට ප්‍රථම ලිඛිතව දැන්විය යුතුය.

iii. සෑම සමෘද්ධි බැංකු කළමණාකරුවෙකු විසින්ම තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රජාමූල බැංකු බල ප්‍රදේශයේ (කලාප) තුල වැඩිම මුදලක් එක්රැස් කළ ප්‍රජාමූල සංවිධානය හා මුදල සඳහන් කරමින්, එක් එක් සමෘද්ධි ප්‍රජාමූල බැංකුව වෙත තැන්පත් පිණිස ලද මුළු මුදල ද සඳහන් කරමින් ලේඛනයක් සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සමඟ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත 2025 අගෝස්තු 06 දිනට ප්‍රථම යැවිය යුතුයි .

iv. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන විෂය භාර නිලධාරී හා ප්‍රජාමූල සංවිධාන විෂය භාර නිලධාරී මගින් තම දිස්ත්‍රික්කය තුළ කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් රැස්කළ ප්‍රජාමූල සංවිධානය ( බැංකු කලාප මට්ටමින්) සමෘද්ධි ප්‍රජාමූල බැංකුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අදාළ මුදල සමග සඳහන් කරමින් ලේඛනයක් සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයාගේ ලිපියක් සහිතව 2025 අගෝස්තු 13 දිනට ප්‍රථම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතුය. (මෙහිදී අත්සන් සහිත මුල් පිටපත ලබාදීම අනිවාර්ය වේ.)

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය සංකේතවත් කරමින් කොඩි සහ ස්ටිකර් පිළිගැන්වීමෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් රැස් කරන ප්‍රජාමූල සංවිධානය, ප්‍රාදේශීය සංවිධානය හා ඊට දායකත්වයක් සපයන වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කලාප සහකාරවරුන්, ප්‍රජාමූල සංවර්ධන නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්, බැංකු කළමනාකරුවන් හා බැංකු සමිති කළමනාකරුවන් ඇතුළු වැඩිම මුදල් රැස් කරන ලද ප්‍රජාමූල හා ප්‍රාදේශීය සංවිධානවල ගරු සභාපතිවරු, පාලක මණ්ඩල වල සභාපතිවරු ඇගයීමේ වැඩසටහනක්ද සැලසුම් කර ඇත.

06. මෙම වැඩසටහන තුළින් ඒකරාශී කර ගන්නා අරමුදල් ප්‍රාදේශීය සංවිධාන ගිණුමට බැරවන හෙයින් එම මුදලින් 90% ක් ප්‍රජාමූල ප්‍රාදේශීය මට්ටමේ සමාජ සුභසාධන වැඩසටහන් සඳහා වැයකළ හැකි අතර (අදාල සංවිධානවල අනුමැතිය ඇතිව) ඉතිරි 10% "ජාතික සමාජ සංවර්ධන අරමුදලට" අනිවාර්යෙන්ම එවිය යුතුය.

මෙම වැඩසටහන තුළින් ඒකරාශී කරන ලද සියළුම අරමුදල් ප්‍රාදේශීය සංවිධාන ගිණුමට නියමිත දිනට බැර කිරීමෙන් පසු 2025.06.30 දිනට පෙර පහත ආකෘතිය සම්පූර්ණ කර "සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලට" එවිය යුතු 10% ක වටිනාකමින් යුතු චෙක්පත

සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ ගිණුම් අංක 0080012772 නමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල අංශය වෙත ලියා පදිංචි තැපෑලෙන් ලබා දීමේ වගකීම සමෘද්ධි බැංකු සමිතියේ කළමණාකරු වෙත පැවරේ. ඒ සඳහා අවශ්‍ය සියළුම සහාය සමාජ සංවර්ධන සහකාර විසින් ලබා දිය යුතු වේ. ඒ සඳහා අංක 01 ආකෘති පත්‍රය භාවිතා කළ යුතු වේ.

**i. 2025 කොඩි වැඩසටහන - ප්‍රාදේශීය වාර්තාව (10%)**

ප්‍රාදේශිය සංවිධානයේ නම :- ...............................................................................

ප්‍රාදේශීය සංවිධාන බල ප්‍රදේශයට අයත් ප්‍රජාමූලසංවිධාන සංඛ්‍යාව :- ............................

| ප්‍රජාමූල සංවිධානයේ නම | ලියාපදිංචි අංකය | 2025.06.25 බැංකු ගත කරන ලද මුදල (රු.) |
|---|---|---|
| | | |
| | | |
| එකතුව | | |

ඒ අනුව රඳවා ගත් 90% මුදල ..........................................................................................
................................ අංක දරණ චෙක්පත මඟින් එවන ලද 10% ක මුදල...............................

...............................................

ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු.

ඉහත ආකෘතිය අනුව තොරතුරු සමෘද්ධි කාර්යාලයට ගෙන්වා ගැනිමේ වගකීම දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂයභාර කළමණාකරුගේ හා ප්‍රජාමූල විෂයභාර කළමණාකරුගේ වගකීම වේ. ඒ පිළිබඳ අධික්ෂණය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු අතර පහත ආකෘතිය අනුව සකස් කරන ලද දිස්ත්‍රික් වාර්තාව 2025.06.30 දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශයට ද පිටපතක් සහිතව ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශය වෙත ලබා දීම සිදු කල යුතුය.

**ii. 202 ජාතික කොඩි වැඩසටහන - දිස්ත්‍රික් වාර්තාව (10%)**

දිස්ත්‍රික්කය :- .................................. ප්‍රාදේශිය සංවිධාන සංඛ්‍යාව :- ..................

| ප්‍රජාමුල සංවිධානයේ නම | ලියාපදිංචි අංකය | රඳවා ගත් 90% මුදල (රු.) | ජාතික සමාජ සංවර්ධන අරමුදලට එවනු ලැබූ 10% මුදල (රු.) |
|---|---|---|---|
| | | | |
| | | | |
| එකතුව | | | |

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි.

........................................ ....................................................

ප්‍රජාමුල විෂය කළමණාකරු සමාජ සංවර්ධන විෂය කළමණාකරු

නිල මුද්‍රාව නිල මුද්‍රාව

දුරකථන අංකය :- ............................... දුරකථන අංකය :- ...............................

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි.

.....................................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

07. 2025 වසරේ ඇගයීම් ක්‍රියාවලිය සකස් කරන විට ප්‍රජාමූල සංවිධාන මට්ටමින් කොඩි අවශ්‍යතා ලබාගන්නා හෙයින් දිස්ත්‍රික් කොඩි ආදායම ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාවෙන් බෙදා සාමාන්‍ය අංගය මත වැඩිම ආදායම් ඉපැයූ දිස්ත්‍රික්ක තේරීමට කටයුතු කරනු ඇත.

08. දිස්ත්‍රික් කාර්යාලවලින් කරන ලද ඉල්ලීමට අනුව ඔබ වෙත ලබාදෙනු ලබන කොඩි, ස්ටිකර්, කැට ලේබල් සියල්ල වැඩසටහන් වෙනුවෙන් යොදා ගත යුතු අතර (විශේෂයෙන් කොඩි) මින් කිසිඳු අයිතමයක් නැවත ප්‍රධාන කාර්යාලයට භාර නොදීමට වගබලා ගත යුතුය.

කොඩි පැලඳවීම් කටයුතු අවසන් කර නියමිත දිනට භාර දීමෙන් අනතුරුව නැවත නැවත මුදල් භාර ගැනීම් සිදු නොකළ යුතු අතර ඔබ විසින් ආදායම් වාර්තා ඉදිරිපත් කිරීමේදී නැවත නැවත සංශෝධනය කිරීමද නොකළ යුතු වේ. එසේ සිදු කිරීම තුළින් විගණන විමසුම් වලට

ලක්වීමක් පසුගිය වසරේ සිදු වූ හෙයින් ඒ සඳහාද වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කළයුතු වේ.

**පැහැදිලි කර ගැනීම :-**

මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් නොපැකිලිව සමාජ සංවර්ධන අංශය භාර අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇමතිමට කාරුණික වන්න.

දුරකථන අංකය - 011 2876601, 0711980287

ඊමේල් අංකය - Socialdev@samurdhi.gov.lk

**සී.ඩී. කළුආරච්චි**

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

01. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස /අ.ක.ස
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස
04. සියළුම අධ්‍යක්ෂවරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස
05. සභාපති, ජාතික සමාජ සංවර්ධන අරමුදල - දැ.ගැ.ස/අ.ක.ස
06. මහා සංගම් සභාපති - දැ.ගැ.ස/අ.ක.ස